සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**8 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේ මල්ල රට අනුපිය නම් අඹවනයට වැඩම කළ අවස්ථාවේ දේවදත්ත කුමරුන් සමඟ පැවිදි බව ලබාගත් අයෙකු වන්නේ,
(1) පිප්ඵලී කුමරු (2) ඡන්න ඇමති (3) භද්දිය කුමරු (4) නන්ද කුමරු

02. තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නඟා ගැනීමට සුදුසු බැවින් ධර්මරත්නය,
(1) ඒහිපස්සික වේ. (2) සන්දිට්ඨික වේ.
(3) ස්වාක්ඛාත වේ. (4) ඕපනයික වේ.

03. දේවදත්ත තෙරුන් සිදුකළ ආනන්තර්ය පාපකර්මයක් වන්නේ,
(1) රහතුන් මැරීම යි. (2) මව මැරීම යි.
(3) පියා මැරීම යි. (4) බුදුරදුන්ගේ ලේ සෙලවීම යි.

04. බුදුරජාණන් වහන්සේ තුළ පැවති සතුටු සාමීචි කථා බහ ඇති බව හඳුන්වනු ලබන්නේ,
(1) පුබ්බභාසී යනුවෙනි. (2) සම්මෝදක යනුවෙනි.
(3) උත්තානමුඛ යනුවෙනි. (4) සබිලබව යනුවෙනි.

05. කිඹුල්වත් නුවර බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ඉදිකොට තිබූ ආරාමය කුමක් ද?
(1) ඝෝෂිතාරාමය (2) රාජකාරාමය (3) නීග්‍රෝධාරාමය (4) ජේතවනාරාමය

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

06. ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ වීදාගම මෛත්‍රී හිමියන් විසිනි. (.......)

07. මට්ටකුණ්ඩලී කථාවෙන් බුදුරජාණන් වහන්සේගේ පුරිසධම්ම සාරථී ගුණය පැහැදිලි වේ. (.......)

08. මසකට දෙවරක් මෙහෙණිය භික්ෂූන් වහන්සේලාගෙන් උපදෙස් ලබාගත යුතුය. (.......)

09. නන්දෝපනන්ද නාග රාජයා දමනය කරන ලද්දේ මුගලන් මහරහතන් වහන්සේ විසිනි. (.......)

10. අන්සතු වස්තුවක් තමාගේ යැයි සිතා වැරදීමකින් ගැනීමෙන් වුවද දෙවැනි සිල් පදයට හානි සිදුවේ. (.......)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දී ඇති වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(වේදේහ රජතුමා / විශාඛා සිටු දුව / අනේපිඩු සිටුතුමා / කම්මක්ඛය / උභයක්ඛය)

11. .................................................................................................... විසින් සැවැත්නුවර දෙව්රම් වෙහෙර කරවන ලදී.

12. මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාව පරීක්ෂා කිරීම සඳහා ...................................................... බොහෝ අවස්ථාවල නොයෙක් ගැටලු ඉදිරිපත් කළේ ය.

13. කර්ම ශක්තිය අවසන් වීම ........................................................................................................ මරණය නම් වේ.

14. .................................................................................................... පූර්වාරාම විහාරය කරවා සසුනට පූජා කළේ ය.

15. ආයුෂය ද කර්ම ශක්තිය ද යන දෙකම අවසන් වීමෙන් සත්ත්වයා මරණයට පත්වීම ........................................................ මරණය නම් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලදී දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| A | | B |
|---|---|---|
| 16. කිසිදාක සිතින්වත් පරපුරුෂයෙකු නොපැතූ කුලවත් කාන්තාව වූයේ, | (.........) | 1. පොක්ඛරසාති බමුණා |
| 17. බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කළේ | (.........) | 2. රාහුල මාලා |
| 18. යශෝධරා දේවිය හැඳින්වූ තවත් නමක් වනුයේ, | (.........) | 3. සෝණදණ්ඩ බමුණා |
| 19. බුදුරදුන්ගේ කථා බහ විශේෂයෙන් අගයකළ අයෙකු වූයේ | (.........) | 4. දීඝණකපිරිවැජියා |
| 20. ඡත්ත මානවකගේ ආචාර්යවරයා වූයේ | (.........) | 5. නකුල මාතා |

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

**සැළකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) පස්වග තවුසන් රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද?

(ii) තුන් බෑ ජටිලයන් අතරින් දෙදෙනෙකු නම් කරන්න.

(iii) ''ගුරුබස සැබෑමය - එය පිළිගැනුම යුතුමය.......'' යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(iv) ධම්ම පද ග්‍රන්ථයේ සඳහන් වග්ග ගණන හා ගාථා ගණන සඳහන් කරන්න.

(v) අහිංසක කුමරුන්ගේ දෙමාපියන් නම් කරන්න.

(vi) රෝහිණී නදියේ ජලය බෙදාගැනීමට යුධ වැදුණ දෙපිරිස නම් කරන්න.

(vii) ඔබේ පෙළ පොතේ සඳහන් පරිදි මහෞෂධ පඬිතුමා විසඳන ලද ප්‍රශ්න දෙක නම් කරන්න.

(viii) සතර සංග්‍රහ වස්තු අතරින් දෙකක් නම් කරන්න.

(ix) කයෙන් සිදුවන අකුසල කර්ම දෙකක් නම් කරන්න.

(x) බුදු දහමට අනුව කර්මය දෙයාකාර වේ. ඒවා නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. (i) බුද්ධ ශාසනයේ අගසව් දෙනම නම් කරන්න. (ලකුණු 02)

(ii) අගසව් දෙනමගේ චරිත වලින් ගත හැකි ආදර්ශ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ඔබගේ ජීවිතය පවත්වාගෙන යාමේ දී කල්‍යාණ මිතුරෙකු ඇසුරු කළ යුත්තේ කුමක් නිසා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) ''යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති........'' යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ විසින් මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය සඳහා ද කුසල් රැස්කර ගත යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) පංචස්කන්ධ ධර්මයන්ගෙන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පුරාණාචාර්යවරු විස්තර කර ඇති දුක්ඛ සත්‍යයේ ආකාර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) බුදුරජාණන් වහන්සේ දේශනා කළ අට වැදෑරුම් දුක්වලින් 05 ක් ලියන්න. (ලකුණු 05)

05. (i) බුද්ධානුස්සති භාවනාව යනු කුමක් ද? (ලකුණු 02)

(ii) බුදු ගුණවලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) බුදුගුණ භාවනාවේ ආනිසංස 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

06. (i) සීලය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) අෂ්ටාංග සීලයෙහි දෙවන ශික්ෂා පදය සඳහන් කර එහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) සිල් ආරක්ෂා කිරීමෙන් පාසල් සිසුන්වන ඔබට ලැබිය හැකි ප්‍රයෝජන කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) දානමය පින්කම

(ii) චුල්ල පන්ථක හිමි

(iii) සේඛියා ශික්ෂාපද

(iv) එකමුතුකම (ලකුණු 2 x 5 = 10)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**08 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2025** **බුද්ධ ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 06 | × | 11 | අනේපිඬු සිටුතුමා | 16 | 5 |
| 02 | 4 | 07 | × | 12 | වේදේහ රජතුමා | 17 | 4 |
| 03 | 4 | 08 | ✓ | 13 | කම්මක්ඛය | 18 | 2 |
| 04 | 2 | 09 | ✓ | 14 | විශාඛා සිටු දුව | 19 | 3 |
| 05 | 3 | 10 | × | 15 | උභයක්ඛය | 20 | 1 |

එක් නිවැරදි පිළිතුරකට ලකුණු2 බැගින් ලකුණු 40 යි

01 (i) අනන්ත ලක්ඛණ සූත්‍රය ඇසීමෙන්

(ii) උරුවේල කාශ්‍යප, ගයා කාශ්‍යප, නදී කාශ්‍යප යන අයගෙන් දෙදෙනෙකු

(iii) ''ගුරු බස සැබෑමය - එය පිළි ගැනුම යුතුමය
පඬි බසත් එයමය - එයින් දෙලොවෙහි මහත් සැපමය''

(iv) වග්ග - 26 / ගාථා - 423

(v) මව - මන්තාණි බැමිණිය / පියා - ගග්ග (භග්ග) බමුණා

(vi) ශාක්‍ය වංශිකයන් හා කෝලිය වංශිකයින්

(vii) වැලියොත් ප්‍රශ්නය හා දණ්ඩක ප්‍රශ්නය

(viii) දානය, ප්‍රිය වචන, අර්ථ චර්යාව, සමානාත්මතාවය

(ix) • සතුන් මැරීම • සොරකම් කිරීම • කාමයෙහි වරදවා හැසිරීම (වැරදි කාම සේවනය)

(x) කුසල කර්මය හා අකුසල කර්මය

(ලකුණු 2 x 10 = 20)

02. (i) සැරියුත් මහ රහතන් වහන්සේ / මුගලන් මහ රහතන් වහන්සේ (ලකුණු 02)

(ii) ප්‍රිය වචන, සමානාත්මතාවය, නොරැවටීම, විශ්වාසය, සමගිය, ප්‍රඥාව, නොපසු බස්නා වීර්ය... ආදී ලෙස සිසුවා සපයා ඇති අදාල පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ලකුණු 03)

(iii) පෙළ පොතෙහි සඳහන් 10 වෙන පාඩමෙහි කරුණු අදාල කර ගෙන සිසුවා සපයා ඇති නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03. (i) '''යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝව චන්දිමා'' (ලකුණු 02)

(ii) යමකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින්ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද, ඒ තැනැත්තා වලා ගැබෙන මිදුණු පුන් සඳ මෙන් මේ ලෝකය බබළවයි. (ලකුණු 03)

(iii) ''පමාවෙන් මිදුණු කෙනෙක් මුළු ලෝකයම එළිය කරයි'' (7 වෙනි පාඩම) යන පාඩමට අදාල සිසුවා මෙලොව පරලොව යහපත උදෙසා කුසල් රැස් කරන අයුරු විස්තර කර ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i)
- රූප (සත්ත්ව ශරීරය)
- වේදනා (සුඛ, දුක්ඛ, උපේක්ඛා යන වේදනානුය)
- සඤ්ඤා (අරමුණු හඳුනා ගැනීම)
- සංඛාර (මානසිකව කරන රැස් කර ගැනීම්)
- විඤ්ඤාණ (ඉන්ද්‍රිය මාර්ගයෙන් අරමුණු කරගෙන ඇති වන දැනුමට) (පාලියෙන් පමණක් තිබේ නම් ලකුණු දෙන්න.) (ලකුණු 02)

(ii)
- දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක)
- විපරිණාම දුක්ඛතා (වෙනස් වීම් පිළිබඳ දුක)
- සංඛාර දුක්ඛතා (සංස්කාර පිළිබඳ දුක)

(පාලියෙන් හෝ සිංහලෙන් පමණක් තිබේ නම් ලකුණු දෙන්න. (ලකුණු 03)

(iii) ජාතිය හෙවත් ඉපදීම / ජරාව හෙවත් වයස් ගත වීම / ව්‍යාධිය හෙවත් රෝග පීඩාවලට ලක්වීම / මරණය හෙවත් ජීවිතයේ අවසානය / අප්‍රියන් හා එක්වීම / ප්‍රියයන්ගෙන් වෙන් වීම / කැමති දේ නොලැබීම / කෙටියෙන් කීවහොත් පංච උපාදාන ස්කන්ධය ම දුකයි. (මින් 5 ක් සඳහන් කර ඇත්නම් ලකුණු දෙන්න.) (ලකුණු 05)

05. (i) නව අරහාදී බුදු ගුණයන් එක් එක් බුදු ගුණය වෙන වෙනම සිහි කිරීමෙන් සිදු කරන ලද භාවනාවයි. (බුදු ගුණ සිහිකරමින් කරනු ලබන භාවනාවයි.) (ලකුණු 02)

(ii) අරහං බුදු ගුණය / සම්මා සම්බුද්ධ ගුණය / විජ්ජාචරණ සම්පන්න ගුණය / සුගත ගුණය / ලෝකවිදූ ගුණය / අනුත්තර පුරිසධම්ම සාරථී ගුණය / සත්ථා දේවමනුස්සානං ගුණය / බුද්ධ ගුණය / භගවා ගුණය (තේරුම පමණක් ලියා තිබුණ ද ලකුණු ලබාදෙන්න.) මින් කරුණු 3 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 03)

(iii)
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ අසීමිත පැහැදීමක් ඇති වීම.
- පාපයට ලැජ්ජාව හා බිය ඇතිවීම.
- සිත තුළ පවතින දරදඬු ඕලාරික ගති ස්වභාවයන් යටපත් වීම.
- රාග, දෝස, මෝහ සිතුවිලි යටපත් වීම.
- බුදු ගුණ ඇසුරෙන් සිත ඍජු භාවයට පත් වීම.
- නිරාමිස සතුටකින් සිත පිරී යෑම.
- නපුරු අදර්මිෂ්ඨ සිතුවිලි පහල නොවීම.
- කායික හා මානසික සංවරය ඇති වීම.
- බිය හා දුක් පීඩා ජය ගත හැකි ශක්තිමත් මනසක් ගොඩනැගීම.
- අන් අයගේ ගරු සැලකිල්ලට ලක් වීම.
- නපුරු සිහින නොදැකීම.
- සුව පහසු නින්දක් ලැබීම.
- සිත ක්‍රමයෙන් සමාධිගත වීම.
- ගුණ නුවණ වැඩි දියුණු වීම.
- මෙලොව දියුණුවත් පරලොව සුගතියත් ඇතිවීම.
- දුකින් පෙළෙන මිනිසුන් අතර නිදුක්ව වාසය කිරීමට හැකි වීම.

ඉහත කරුණුවලින් 5 ක් ලියා ඇතිනම් සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 05)

06. (i) කය, වචනය සංවර කර ගැනීමයි. (ලකුණු 02)

(ii) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාධියාමි (...... හිමියන් විසින් කැමැත්තෙන් නුදුන් දෙයක් සොර සිතින් ගැනීමෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි.) (මම සොරකම් කිරීමෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි.) (ලකුණු 03)

(iii) පෙළ පොතේ එන ශීල ශික්ෂාවේ ඉදිරි පියවර ....... අනුව හා පංච ශීලය, අවරණය කිරීම, අෂ්ඨාංගික ශීලය ආරක්ෂා කිරීම යන කරුණු සැලකිල්ලට ගෙන දරුවා පෙළ ගස්වා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07. (i) පෙළ පොතේ එන ''අපේ සිරිත් අපි සුරකිමු'' පාඩම අනුව දානමය පින්කම පිළිබඳව කරුණු ඇතුලත් කර ඇති පිළිතුරකට ලකුණු දෙන්න.
- දානයේ පෙර සූදානම
- දානය පූජා කරන අවස්ථාව
- දානයන අවසන් කිරීම - යන කරුණු ඇතුලත් විය යුතුයි. (පිටු අංක - 28, 29)

(ii) පෙළ පොතේ පළමු පාඩමේ එන ''චුල්ල පන්ථක හිමියන් රහත්වීම'' යන මාතෘවට අදාලව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (පිටු අංක - 5, 6)

(iii) පෙළ පොතේ එන සඟරුවනට අනුව හුරු පුරුදු වෙමු. ''සුසිරිත්'' පාඩමේ සඳහන් වන ''සේඛියා ශිෂා පද'' පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදු කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (පිටු අංක - 54, 55)

(iv) ''එකමුතුව දිවි ගෙවමු'' 12 වෙනි පාඩමට අනුව 'එකමුතුකම'' පිළිබඳව ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (පිටු අංක - 33, 34) (ලකුණු $2 \times 5 = 10$)